සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / දෙවන වාරය - ජුනි මාසය - 3 වන සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වී. අසංක දේශප්‍රිය අබේරත්න.

# 19 ඒකකය - මුදල් 1

දුවේ , පුතේ අද අපට තියෙන්නේ මුදල් කියන ඒකකය. අපි මුලින්ම පහත ක්‍රියාකාරකමේ නිරත වෙමු. මේ සඳහා ගෙදර ඉන්න වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න හොඳද.......

1. මුලින්ම අප භාවිතා කරන සැබෑ කාසි වැඩිහිටියන් සමග එකතු වී සොයා ගන්න.ඔබ සොයා ගන්නා ලද කාසි වැඩිහිටියන් සමග එකතුව අඩුම අගයේ සිට වැඩිම අගය දක්වා පෙළ ගස්වන්න.අප දැනට ගනුදෙනු සඳහා යොදා ගන්නා සත අගයක් ඇති කාසි හැකි නම් සොයා ගන්න.සත අගයක් ඇති කාසි ගෙන හොඳින් නිරීක්ෂණය කරන්න.ප්‍රමාණය , හැඩය , බර , වර්ණය ආදිය.අනතුරුව රුපියල් අගයක් ඇති කාසි ගෙන හොඳින් නිරීක්ෂණය කරන්න.ප්‍රමාණය , හැඩය , බර , වර්ණය ආදිය.

2.වෙළඳ පොළෙන් භාණ්ඩ මිළ දී ගැනීමේ දී ලැබෙන මිල දර්ශනයක් සොයා ගෙන එහි සඳහන් භාණ්ඩ හා මිල පිළිබඳව වැඩිහිටියෙකුගෙන් අසා දැන ගන්න.ඔබ හඳුනා ගන්නා ලද දැනට භාවිතයේ පවතින කාසි හෝ නෝට්ටු භාවිතා කර එම මිල දර්ශනයේ සඳහන් එක් එක් භාණ්ඩවල මිල ගෙවිය හැකි ආකාර පිළිබද ආදේශ නෝට්ටු හා කාසි භාවිතා කරමින් සොයා බලන්න.

3. වැඩිහිටියෙකු හෝ යහළුවකු සමග එක්ව මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.ආදේශ කාසි හා නෝට්ටු සූදානම් කර ගන්න. ඉන් පසුව මිතුරාට ඇස් පියාගෙන කාඩ් පතක් ගෙන පෙන්වීමට කියන්න.අනතුරුව මිතුරාට 1 සිට 10 දක්වා ගණන් කිරිමට කියන්න. ඔබ මිතුරා පෙන්වූ පත්‍රිකාවේ සඳහන් මුදල ඔබ අත ඇති අදේශ කාසි හෝ නෝට්ටු යොදා ගෙන සකස් කර පෙන්වන්න.මිතුරා ගණන් කිරිමට පෙර ඔබ අවසන් කළ හොත් ඔබ ලකුණු 10 ක් හිමි වේ.ඔබට නිවැරදිව සකස් කිරීමට නොහැකි වුවහොත් ලකුණු නැත.වරදින එක වාරයකට ලකුණු 5 බැගින් අඩුවේ.මේ ආකාරයට ක්‍රීඩාවක් ලෙස මාරුවෙන් මාරුවට සිදු කරන්න.

4.පහත දැක්වෙන වගුව පුරවන්න.

| කාසිය | සත 1 කාසි ගණන | සත 5 කාසි ගණන | සත 10 කාසි ගණන | සත 25 කාසි ගණන | සත 50 කාසි ගණන |
|---|---|---|---|---|---|
| රුපියල | | | | | |
| රුපියල් 2 | | | | | |
| රුපියල් 5 | | | | | |
| රුපියල් 10 | | | | | |

5.පහත දැක්වෙන භාණ්ඩ ගෙවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණ ඇඳ දක්වන්න.

| ද්‍රව්‍ය | වටිනාකම | ගෙවන ආකාරය |
|---|---|---|
| පාසල් බෑගය | රුපියල් 2500.00 | |
| සපත්තු යුගල | රුපියල් 2758.00 | |
| කමිසයක් | රුපියල් 980.50 | |
| කලිසමක් | රුපියල් 1250.00 | |
| කුඩයක් | රුපියල් 750.50 | |